# පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

# 2018 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

## හැඳින්වීම

2018 වර්ෂය තුලදී මෙම කාර්යාලය මගින් ඉටු කරන ලද කාර්ය සහ කර්තව්‍ය හා සම්බන්ධ කරුණු පිළිබඳව අදහස් දැක්වීමට ප්‍රථමයෙන්; පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (මෙහි මින් මතු ඔම්බුඩ්ස්මන්වරයා යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යභාරය පිළිබඳව, ආරම්භයේදීම සඳහන් කිරීමට කැමැත්තෙමි. එබඳු පසුබිමක, පසුගිය වසර තුලදී ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඉටු කළ කාර්යයන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වනු ඇත. තවද, මා ඔම්බුඩ්ස්මන්වරයා ලෙස රාජකාරි භාරගනු ලැබූයේ 2019 ජනවාරි 30 දින වන අතර, මවිසින් වාර්තා කරනු ලබන්නේ මාගේ පූර්වගාමික ඔම්බුඩ්ස්මන්වරයාගේ නිල කාලය තුල සිදු වූ කරුණු පිළිබඳව බව ද සඳහන් කළ යුතුය.

## කාර්ය සහ කර්තව්‍ය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධූරය සංස්ථාපනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු බවට ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව මගින් නියම කරනු ලැබ ඇති අතර; රජයේ නිලධාරියෙකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයෙකු විසින් හෝ සිය රාජකාරි ඉටු කරන අතරතුර සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් කඩකිරීම හෝ වෙනත් අයුක්තීන් පිළිබඳ පැමිණිලි හෝ චෝදනා පරීක්ෂා කිරීමේ සහ වාර්තා කිරීමේ කාර්යය, එම තනතුර වෙත පැවරී ඇත.

ඒ අනුව, ඔම්බුඩ්ස්මන් කාර්යාලය සංස්ථාපනය කරමින් 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පනවනු ලැබ ඇති අතර එම පනතෙහි ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය විස්තර කර නිශ්චිතව දක්වා ඇත. අනතුරුව, මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ වෙනත් අයුක්තීන් පිළිබඳ පැමිණිලි ඔම්බුඩ්ස්මන්වරයා හට සෘජුවම මහජනතාව වෙතින් ලබා ගැනීමට සහ ඒවා ඒ අනුව භාර ගැනීමට හැකිවන අයුරින්, 1994 අංක 26 දරන පනත මගින් ඉහත සඳහන් පනත සංශෝධනය කරන ලදි. සිදු වී යැයි කියනු

ලබන චෝදනා පිළිබඳව ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කර, විමර්ශනය කරනු ලැබිය යුතු අතර පැමිණිල්ලට සම්බන්ධ අදාල රජයේ නිලධාරියාගේ තීන්දුව, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම නීතියට පටහැනි වූයේ ද, අයුක්තිසහගත, පීඩාකාරී නැතහොත් නොමනා වෙනස්කම් දක්වන්නක් වූයේ ද, නැතහොත් නොමනා කාර්යයක් සඳහා අදාල නිලධාරියාගේ අභිමතය අනුව ක්‍රියාකරමින් කරන ලද්දේ ද, යන්න පිළිබඳව නිශ්චය කළ යුතුය. පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකම්, රජයේ නිලධාරියෙකු විසින් කඩකර ඇති බවට හෝ එබඳු නිලධාරියෙකු විසින් සිදු කළ අයුක්තියකින් පීඩා විඳ ඇති බවට, නිසි පරීක්ෂණයකින් අනතුරුව ඔම්බුඩ්ස්මන්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඒ අනුව, ඔහු සිය නිශ්චය කිරීම සිදු කරනු ලබයි. බලපෑම සිදු වූ පුද්ගලයා වෙත සලසනු ලබන සහන ලෙස, අදාල රජයේ නිලධාරියා විසින් සිදු කරන ලද ක්‍රියාව නැවත සලකා බලන ලෙස, නිවැරදි කරන ලෙස, අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නිර්දේශ කළ හැකි අතර, එම රජයේ නිලධාරියා අයත්වන ආයතනයේ ප්‍රධානියා විසින් එම නිර්දේශ නිශ්චිත කාලයක් තුල ක්‍රියාත්මක කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා විසින් යෝජනා කරනු ලබන පියවර පිළිබඳව දැනුම් දිය යුතුය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වශයෙන් වරෙක කටයුතු කළ සෑම් විජේසිංහ මහතා ජනරජයේ පළමුවන ඔම්බුඩ්ස්මන්වරයා වූ අතර, 1984 වසර සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි පැහැදිලි කර ඇත.

> *"ඔම්බුඩ්ස්මන්වරයා පාර්ලිමේන්තුවේ නිලධාරියෙකි. ප්‍රධාන වශයෙන් ඔහුගේ කාර්යය වනුයේ පාර්ලිමේන්තුව විසින් සම්ප්‍රදායිකව ඉටු කරනු ලබන්නකි. එනම් - පුද්ගලයන්ගේ දුක්ගැනවිලි වලට සහන සැලසීමයි. වර්තමානයේ පාර්ලිමේන්තුව යම් යම් දුක්ගැනවිලි වලට සහන සැලසීමට වඩා සාමාන්‍යයෙන් ව්‍යවස්ථා සම්පාදන කාර්යයන් සඳහා ස්වකීය කාලයෙන් බොහෝ ප්‍රමාණයක් වැය කරතැ යි සලකතොත් නිලධාරි පන්තිය සමග කටයුතු කිරීමේදී පුද්ගලයන්ට විඳින්නට සිදු වන අසාධාරණකම් පිළිබඳ සහන සැලසීම සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයා සහ උසාවි වැදගත් කොට සලකනු ලැබේ... ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යභාරයට පුරවැසියා සහ රජය මුණ ගැහෙන අවස්ථා ද ඇතුළත් වේ. ඒ බැවින්, ඔම්බුඩ්ස්මන්වරයාගේ ව්‍යවස්ථාගත තත්ත්වය ඇතැම්විට වඩාත් ආනන්දජනකය."*

ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමට සහ රජයේ සහ සමාන වෙනත් ආයතනවල නිලධාරින්ගේ ක්‍රියාවන් මගින් සිදුවන වෙනත් අයුක්තීන්ගෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත උතුම් රාජකාරියක් පැවරී ඇති බව පැහැදිලි වේ. එමෙන්ම, ජනතාවගේ එකී අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාවන්හි අඩංගු කරුණු සහ ව්‍යවස්ථාදායක අණපනත් සහ ඒවායේ රෙගුලාසිවල සඳහන් විධිවිධාන ද රාජ්‍ය ආයතන මගින් නිකුත් කළ විවිධ චක්‍රලේඛවල අඩංගු රීතීන් ද සැලකිල්ලට ගෙන රජයේ පරිපාලන ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම ද ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යයක් වන බව සඳහන් කළ යුතුය.

### නිර්දේශ නිකුත් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය

මෙම කාර්යාලය වෙත ලැබෙන සෑම පැමිණිල්ලක්ම/පෙත්සමක්ම වෙනම ලේඛනයකට ඇතුලත් කරනු ලබන අතර, ඉන් අනතුරුව එම පැමිණිල්ල සඳහා විශේෂිත අංකයක් ලබා දෙනු ලබයි. ඉන්පසු මෙම පැමිණිලි, විශ්‍රාම වැටුප්, ඉඩම්, අනවසර ඉදිකිරීම්, තනතුරෙහි නැවත පිහිටුවීම, පාසල්වලට ඇතුලත් කිරීම ආදිය ලෙස විෂයයන් අනුව වර්ගීකරණය කරනු ලැබේ. මෙම කාර්යාලයේ නිලධාරීන් වෙත පවරා ඇති සහ ඔවුන් විසින් කටයුතු කරන විශේෂිත විෂයයන් මේවා වන අතර එම නිලධාරීන් රාජ්‍ය සේවයේ "රාජ්‍ය කළමනාකරණ සහකාර" යන කාණ්ඩයට අයත් වේ. පැමිණිල්ලක් ලියාපදිංචි කිරීමෙන් පසුව එය අදාල රාජ්‍ය කළමනාකරණ සහකාර (විෂයභාර ලිපිකරු) වෙත යොමු කරනු ලබන අතර, ඉන් අනතුරුව එක් එක් පැමිණිල්ල සඳහා ලිපිගොනුවක් විවෘත කිරීම ඔවුන් සතු කාර්යයක් වේ. මෙම විෂය ප්‍රස්තුතය තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ කාර්යාලයේ ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාරවරිය විසිනි.

යම් පැමිණිල්ලකට අදාලව ලිපිගොනුවක් විවෘත කළ විට එම පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සාරාංශගත කරමින් අදාල විෂයභාර ලිපිකරු විසින් ලිපිගොනුවෙහි ජර්නල් සටහනක් යොදනු ලබයි. ඉන් පසු ඔහු/ඇය විසින් පරිපාලන නිලධාරිනිය සමග පැමිණිල්ලේ ස්වභාවය පිළිබඳව සාකච්ඡා කර, ඔවුන් දෙදෙනාම ඔම්බුඩ්ස්මන්වරයා හමුවට පැමිණ පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව, ඔහුගේ උපදෙස් හා මගපෙන්වීම ලබා ගනියි.

එය ඉතා වැදගත් හමුවක් වන අතර, එම අවස්ථාවේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලැබී ඇති පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සහ එම පැමිණිල්ල සමග අමුණා ඇති අනෙකුත් ලේඛන ද සුපරික්ෂාකාරීව සලකා බලනු ලැබේ. පළමුව සහ ප්‍රධාන වශයෙන් පරික්ෂා කළ යුතු වන්නේ

පැමිණිල්ල/චෝදනාව ඔම්බුඩ්ස්මන්වරයාගේ බල සීමාව ඇතුලතට ගැනෙන්නේ ද යන්න නිශ්චය කිරීමයි. මෙම කරුණ නිශ්චය කිරීමේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ (මෙහි මින් මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) 10, 11 සහ 17 යන වගන්තිවල අන්තර්ගත කරුණු වෙත සිය අවධානය යොමු කරනු ලබයි. එම පැමිණිල්ල පනතේ විෂය පථය තුලට නොගැනෙන්නේ නම්, එම කරුණ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් පැමිණිලිකරු වෙත ඒ පිළිබඳව වහාම දැනුම් දෙනු ලැබේ.

ඔම්බුඩ්ස්මන්වරයා විසින් අදාල ඉල්ලීමේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට තීරණය කරන විට එක් එක් පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව ඔහු විසින් සුදුසු යැයි නිගමනය කරනු ලබන නියෝගයන් කරනු ලැබේ. අපේක්ෂිත සහනය සහ පැමිණිල්ල සිදු කරනු ලබන්නේ කාට එරෙහිව ද ආදී කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය බවට ඔම්බුඩ්ස්මන්වරයාට හැඟේ නම් එම තොරතුරු පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එසේ ඉල්ලා සිටින විශේෂිත තොරතුරුවලට අමතරව මෙම කාර්යාලය විසින් පැමිණිලිකරු වෙත විශේෂිත ආකෘති පත්‍රයක් (OMB 01 ආකෘති පත්‍රය) යවනු ලබන අතර, එහි සඳහන් වන තොරතුරු සපයන ලෙස ඔහු/ඇය ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ඉන්පසු, පනතෙහි විධිවිධාන වලට අනුකූලව එම කරුණ විමර්ශනය කොට අවසන් කිරීමට සෑම උත්සාහයක්ම දරනු ලබන අතර, එම කටයුත්ත සත්‍ය වශයෙන්ම පැමිණිල්ලේ ස්වභාවය මත රඳා පවතී.

අදාල කරුණ පිළිබඳ විමර්ශනය ඉදිරියට සිදුකරගෙන යාමට තීරණය කරන අවස්ථාවක සාමාන්‍යයෙන් නිරීක්ෂණ කැඳවනු ලබන්නේ චෝදනාවට ලක්ව ඇති නිලධාරීන්ගෙනි. නිරීක්ෂණ කැඳවීමේ එම ලිපි ඔම්බුඩ්ස්මන්වරයා වෙත ලද විගසම, පැමිණිලිකරු ඉල්ලා ඇති සහන සැලසීම සඳහා අදාල බලධාරීන් විසින් තීරණය කර ඇති අවස්ථාවන් ද ඇත. එසේ නොමැතිව, එම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා සිහි කැඳවීම් කිහිපයක් යැවීමට ද මෙම කාර්යාලයට සිදු වූ අවස්ථා ද ඇත. ලිපි කිහිපයක් හුවමාරු වීමෙන් පසුව පවා ඔම්බුඩ්ස්මන්වරයාට අර්ථාන්විත ප්‍රතිඵලයක් දැක ගැනීමට ලැබුණු අවස්ථාවන් ද සැහෙන සංඛ්‍යාවක් විය. ඔම්බුඩ්ස්මන්වරයා හට පිළිගත හැකි තීරණයකට එළඹීමට නොහැකි අවස්ථාවන් හිදී පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අදාල පාර්ශවයන් මෙම කාර්යාලය වෙත කැඳවනු ලබයි. මෙම පරීක්ෂණය පැවැත්වෙනුයේ, සෑම පාර්ශවයක් සඳහාම තමාට අදාල කරුණු එකිනෙකා ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් ස්වභාවික යුක්තියේ රීතීන් පිළිපදිමිනි.

පෙර සඳහන් කළ පරිදි, මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් හෝ වෙනත් අයුක්තියක් ඔප්පු වූ ඕනෑම විටක, ඔම්බුඩ්ස්මන්වරයා විසින් වින්දිතයා හට සහන සැලසීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ. එබඳු ක්‍රියාමාර්ගයක් තුලින් පිළිගත හැකි විසඳුමකට එළඹීමට ඔහු අපොහොසත් වුවහොත්, අදාල කරුණ විසඳීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට නියම කරනු ලැබේ. ඔම්බුඩ්ස්මන්වරයාගේ එම සියලු උත්සාහයන් අසාර්ථක වුවහොත්, ඔහු එම ගැටලුව පිළිබඳව තීන්දුවක් ගෙන, ඒ අනුව නිර්දේශ කරමින් එය වගඋත්තරකාර පාර්ශවය වෙත දැනුම් දෙන අතර දී ඇති කාල සීමාවක් තුල එම තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස ද දැනුම් දෙනු ලැබේ. එසේ නිශ්චිතව ලබා දුන් කාල සීමාව තුලදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිනම් ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඔහුගේ වාර්තාවේ පිටපතක්, සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජනාධිපතිවරයා සහ කථානායකවරයා වෙත යොමු කරනු ලැබේ. ඔම්බුඩ්ස්මන් කාර්යාලය ඉහත සඳහන් ක්‍රියාදාමය අනුගමනය කිරීමේදී සෑම විටම රහස්‍යභාවය ඉතාමත් ඉහල මට්ටමකින් පවත්වාගෙන යනු ලබන බව මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත්‍ර සැකසීමේ ක්‍රමවේදය සහ ඉන්පසු ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කිරීමෙන් අනතුරුව, ඔම්බුඩ්ස්මන්වරයාගේ මැදිහත්වීම අපේක්ෂා කළ ඉල්ලුම්කරුවන් සඳහා මෙම කාර්යාලය මගින් විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සලසන ලද සහන සම්බන්ධ කරුණු කිහිපයක් වෙත යොමු වීමට අදහස් කරමි. එය, මෙම කාර්යාලය වෙත සිදු කරන ඉල්ලීම්වල ස්වභාවය සහ ආකාර පිළිබඳව නියමාකාරයෙන් අවබෝධ කර ගැනීමට උපකාරි වනු ඇත.

**අංකය : OMB/P/2/10/1177** **නම : කේ.බී.ජයරත්න පෙරේරා මයා**

මෙම කාරණාවේ දී, නාය යෑම් සහ ගංවතුර මගින් පීඩාවට පත් ජනතාව නැවත පදිංචි කිරීමේ අරමුණ සහිතව රජය විසින් අත්පත් කර ගත් අක්කර 25ක භූමි ප්‍රමාණයකින් යුතු ඉඩමක රජය විසින් පවුල් 85ක් පදිංචි කරන ලදි. ඉහත සඳහන් කළ අක්කර 25න් අක්කර 05ක් කිතුල්ගල පොලිස් ස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා වෙන් කර තිබුණි. එම නිවාසවල ජීවත්වන ජනතාව, පොලිස් ස්ථානය ඉදි කිරීම සඳහා වෙන් කළ ඉඩම හරහා වැටී තිබුණු මාර්ගයක් භාවිතා කරමින් සිට තිබුණි. ඉන්පසු, ඉහත සඳහන් ඉඩමේ ඉදි කරන ලද නිවාසවල ජීවත්වන එහි පදිංචි කළ ජනතාව විසින්, පොලිසිය ඔවුන්ගේ මාර්ගය භාවිතා කිරීමේ අයිතියට බාධා පමුණුවන බවට වන පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදි. ප්‍රදේශයේ පොලිස් අධිකාරිවරයාගෙන් සහ කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් වාර්තා කැඳවීමෙන් අනතුරුව,

පැමිණිල්ල සිදු කළ ජනතාවගේ භාවිතය සඳහා අඩි 08ක් පළල පාරක් ලබා දිය යුතු බවට 2018 මාර්තු 10 වනදා ඔම්බුඩ්ස්මන්වරයා විසින් නිර්දේශ කරන ලදි. ඒ අනුව, පොලිස්පතිවරයා විසින් එම ඉල්ලීම පිළිගෙන ඔම්බුඩ්ස්මන්වරයා විසින් යෝජනා කළ පරිදි මාර්ගය භාවිතා කිරීමට ජනතාවට අවසර ලබා දෙන ලදි.

**අංකය : OMB/P/2/10/1284** **නම : ඉරේෂ මධුශංක ලියනගේ මයා**

මෙම කාරණයේ දී ඉල්ලුම්කරු විසින් සිය දියණිය බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයේ 1වන ශ්‍රේණිය සඳහා ඇතුලත් කර දෙන ලෙස ඉල්ලීමක් කර තිබුණි. පාසල වෙත ඇති දුර තීරණය කිරීම සඳහා උපයෝගි කර ගන්නා ලද ඉඩම් ඔප්පුව හා සම්බන්ධ ගැටලුවක් හේතුවෙන් දරුවා එම පාසලට තේරී නොතිබුණි. ඇගේ නම තෝරාගත් ලැයිස්තුවට ඇතුලත් කිරීම සඳහා අඩු වී තිබුණේ එක් ලකුණක් පමණි. මෙම කාර්යාලය විසින් එම කරුණ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා, දරුවා එම පාසලට ඇතුලත් කර ගන්නා බවට විදුහල්පතිවරයා එකඟ කර ගැනීමට හැකි විය. එය 2018 මාර්තු 16වන දින ගන්නා ලද තීරණයකි.

**අංකය : OMB/P/2/7/318** **නම : ඩී.ජී.කේ.කරුණාරත්න මයා**

කරුණාරත්න මයා විසින්, ඔහු විශ්‍රාම ගැනීමට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ පිහිටුවනු ලැබූ නමුත් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔහු එම සේවයේ II/I ශ්‍රේණියේ පිහිටුවා ඇති බවට පැමිණිල්ලක් සිදු කරන ලදි. මෙම කාර්යාලය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් නිරීක්ෂණ කැඳවූ අතර, මෙහිදී ඔහු විසින් අදාල පැමිණිලිකරුට ඉහල විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හැකි වන අයුරින් ඔහු එම සේවයට අදාල නියමිත ශ්‍රේණියේ පිහිටුවන ලෙසට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දී තිබුණි. ඉන්පසු ඉල්ලම්කරු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ පිහිටුවන ලද අතර ඒ අනුව නව වැටුප් ප්‍රමාණය අනුව ගණනය කළ විශ්‍රාම වැටුප ලබා ගැනීමට හැකි විය. මෙම තීරණය ඉල්ලුම්කරු විසින් 2018 ඔක්තෝබර් 11වන දින මෙම කාර්යාලය වෙත දැනුම් දෙන ලදි.

**අංකය : OMB/P/2/11/27** **නම : එස්.පී.මංජු ප්‍රසංක මයා**

ඉල්ලුම්කරු ඔහුගේ පාසල් වියේදී ගසකින් වැටීම හේතුවෙන් ආබාධිත පුද්ගලයෙකු බවට පත් වී ඇත. රජය විසින් ආබාධිත පුද්ගලයන් වෙත ලබා දෙන දීමනාව ඔහු වෙත ද ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි. ඔහු මෙම දීමනාව ලබා ගැනීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයාගේ උපකාරය අපේක්ෂා කර තිබුණි. ඔම්බුඩ්ස්මන්වරයාගේ මැදිහත්වීමෙන් අනතුරුව, ඉල්ලුම්කරු වෙත

රු.3000/-ක මාසික දීමනාවක් 2018 මාර්තු 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට බේරුවල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තීරණය කරන ලදි.

**අංකය : OMB/P/2/9/382** **නම : ඩබ්ලිව්.ඒ.ඒ.වේරහැර මයා**

වේරහැර මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු ලෙස සිටි නමුත් ඔහු හිමිකම් ලබා තිබූ වාහන බලපත්‍ර ලබා ගැනීමේ අයිතිය, ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. ඉන්පසු, ඔම්බුඩ්ස්මන්වරයාගේ මැදිහත්වීමත් සමගම, පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් වාහනයක් ආනයනය කිරීම සඳහා ඉල්ලුම්කරුගේ නමින් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද අතර ඒ පිළිබඳව පැමිණිලිකරු විසින් 2018 මැයි 3 දිනැති ලිපිය මගින් ඒ බව මෙම කාර්යාලය වෙත දැනුම් දෙන ලදි.

**නිරීක්ෂණ සහ යෝජනා**

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත හා එයට අදාල සංශෝධිත පනත් මගින් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ඔම්බුඩ්ස්මන්වරයාගේ විෂය පථය තුලට ගැනෙන පැමිණිලි විමර්ශනය කරනු ලබයි. ඒ අනුව, පසුගිය වර්ෂය තුලදීත් ඉහත සඳහන් පනතෙහි අඩංගු විධිවිධාන අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, රජයේ නිලධාරීන්ගේ ක්‍රියාවන් මඟින් ඉල්ලුම්කරුවන්ට සිදු වී ඇතැයි කියනු ලබන අයුක්තීන් නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලැබීය. එම කාර්යයේදී, සහන සැලසීම සඳහා අප වෙත යොමු කරනු ලබන, සිදු වී ඇතැයි කියනු ලබන අයුක්තීන් සඳහා පිළියම් යෙදීමට මෙම කාර්යාලය විසින් සෑම ප්‍රයත්නයක්ම දරන ලදී. ගැටලුව මිත්‍රශීලී ලෙස විසඳා ගැනීමට නොහැකි වන කරුණු සම්බන්ධයෙන්, එක් එක් අවස්ථාවට අනුකූලව, මෙම කාර්යාලය මඟින් නිර්දේශ ලබා දෙනු ලැබේ. ආරවුල් විසඳීමේදී මෙම කාර්යාලය මඟින් අදාල නිලධාරීන් වෙත ලිපි යොමු කරමින් සහ දුරකතන මාර්ග ඔස්සේ සම්බන්ධ කර ගනිමින් පවා එම ආරවුල් කඩිනමින් විසඳා ගැනීමට සෑම උත්සාහයක්ම දරන ලදී. සමාලෝචිත වර්ෂය තුලදී, ලඝු ක්‍රියාමාර්ග තුලින් අවසන් කරන ලද පැමිණිලි 730ක් ද , අන්තර්-පාර්ශව කැඳවීමෙන් පැමිණිලි 16ක් ද විමර්ශනය කර, සම්පූර්ණ වශයෙන් පැමිණිලි 746 ක් අවසන් කරන ලදී. පැමිණිලි 479 ක් කටයුතු අවසන් නොවී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2019 වර්ෂයට යොමු කිරීමට සිදු විය.

පුද්ගලික පාර්ශවයන් අතර සිදුවන ආරවුල් සහ අධිකරණ හමුවේ විභාග වූ හෝ විභාග වන කරුණු පිළිබඳ කටයුතු ඔම්බුඩ්ස්මන්වරයාගේ බලසීමාවෙන් පරිබාහිර වේ. සැලකිය යුතු තවත් කරුණක් වනුයේ මෙම කාර්යාලය වෙත ඉල්ලීම් සිදු කිරීමේදී සිදුවන අනිසි ප්‍රමාදයයි. අදාල

ඉල්ලීම් කිරීම වලක්වාලමින් කටයුතු කිරීම සඳහා විශේෂ තත්ත්වයන් පවතීනම් මිස, එබඳු ප්‍රමාදයන් කිසියම් පැමිණිල්ලක් ආරම්භයේ දීම ප්‍රතික්ෂේප වීමට හේතු වනවා ඇත.

මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වනුයේ බොහෝ අවස්ථාවන්හිදී සහන අපේක්ෂාවෙන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන් සහ වෙනත් සංවිධාන සහ නියෝජිතායතන වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත යොමු කරනු ලැබීමයි. මෙබඳු අවස්ථාවලදී බලධාරීන් විසින් එක් කරුණකට අදාලව විවිධ තීරණ ලබා දිය හැකි අතර, එකම ගැටලුව සඳහා ඔවුන්ගේ වටිනා කාලය සහ සම්පත් වැයවීම සිදු වන බව සඳහන් කළ යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස, අදාල රජයේ නිලධාරීන්ට මෙන්ම ඔම්බුඩ්ස්මන් කාර්යාලය වැනි ආයතනවලට යම් තීරණයක් ක්‍රියාත්මක කිරීමට යාමේදී දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවේ. එබඳු තත්ත්වයන් සලකා බලා, මෙම කාර්යාලය වෙත ලැබෙන එවැනි පැමිණිලි පිටපත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා යොමු වීමක් කරනු නොලබයි.

සඳහන් කළ යුතු තවත් කරුණක් වනුයේ, පරීක්ෂණ ආරම්භ කිරීම සඳහා ඉල්ලුම්කරුවන් විසින් අප වෙත සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීමයි. එබඳු අවස්ථාවන්හිදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලෙසට මෙම කාර්යාලයට ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමට සිදු වේ. ඕනෑම අවස්ථාවකදී, ඉල්ලීම සිදු කරනු ලබන්නේ කුමන නිලධාරීන්ට එරෙහිවද සහ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතු වූ සැබෑ තීරණය ආදී, අවශ්‍ය තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා විශේෂිත ආකෘති පත්‍රයක් (OMB 01 ) සියලුම ඉල්ලුම්කරුවන් වෙත, අප විසින් යවනු ලබන අතර, එහි සඳහන් ප්‍රශ්න සඳහා ඔවුන් විසින් පිළිතුරු සැපයීම අවශ්‍ය වේ.

මෙම කාර්යාලය වෙත ලැබෙන ඉල්ලුම් පත්‍රවල ස්වභාවය පිළිබඳව අදහස් දැක්වීමට කැමැත්තෙමි. දරුවන් සිය කැමැත්ත අනුව තෝරාගත් පාසල්වලට ඇතුලත් කර නොගැනීම සම්බන්ධයෙන් දෙමව්පියන් විසින් චෝදනා ඉදිරිපත් කර ඇත. එසේම, විදුහල්පති සේවය වෙත සුදුසුකම් ලබන ලිඛිත පරීක්ෂණයේදී ප්‍රමාණවත් ලකුණු ලබා තිබුණ ද විදුහල්පති ශ්‍රේණිය සඳහා පත්වීම් ලබාදීමේදී ඔවුනට වෙනස් කොට සලකා ඇති බව කියමින් ගුරුවරුන් විසින් ඉදිරිපත් කළ පැමිණිලි විශාල සංඛ්‍යාවක් විය.

එසේම විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ මාරුවීම්, වැටුප් වර්ධක, උසස්වීම්, හිඟ වැටුප්, දීමනා සහ විශ්‍රාම වැටුප් වලට අදාලව තීරණ ගැනීමේදී ඔවුනට සිදු වූ අසාධාරණකම් පිළිබඳව ද පැමිණිලි කරමින්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් විසින් සිදු කළ ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ගොනුගත කර ඇති බව සඳහන් කිරීමට අවශ්‍ය වේ. එම ඉල්ලුම්පත්‍ර වලට අදාලව අපේක්ෂිත පරිදි බලධාරීන්ගේ නිරීක්ෂණ ලබාගැනිමේදී අප හට දුෂ්කරතාවලට මුහුණ පෑමට ද සිදු වී තිබේ.

සමහර ආයතන, වාර්තා කැඳවූ විට එකී වාර්තා ඉදිරිපත් කිරීමට මැලි බවක් දැක්වීම කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය. එබඳු ආයතන අතුරින් මහවැලි අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ප්‍රධාන තැනක් ගනී. තවද, මහවැලි අධිකාරිය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැඩි ප්‍රතිපත්තියක සිට ඔවුන් විසින් ගෙන ඇති තීරණ වෙනස් කිරීමට අකමැත්තක් දක්වන බව සඳහන් කළ යුතුය. අදාල පරීක්ෂණය සඳහා මහවැලි අධිකාරියේ කලාප අධ්‍යක්ෂකවරයා හට මෙම කාර්යාලයෙහි පෙනී සිටින ලෙස දැනුම් දුන් විට, තීරණ ගැනීමට බලයක් නොමැති ඉඩම් නිලධාරියෙකු ඒ සඳහා ඉදිරිපත් කිරීම මගින් එම ආකල්පය පෙනී යයි. මෙවැනි ආයතනවලින් සහන අපේක්ෂා කරන අසරණ ජනතාවට මෙබඳු ආකාරයේ හැසිරීම් ඍජු ලෙස බලපෑම් ඇති කරන බව මාගේ අදහස වේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එරෙහිව ලැබෙන පැමිණිලි සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි. එයට හේතුව විය හැක්කේ අදාල නිලධාරීන් සිය නිල රාජකාරි ඉටු කිරීමේදී තීරණ ගැනීමේ දක්වන ආකල්පයයි. ඔවුන් නීති රාමුව තුල පමණක් කටයුතු කිරීමකින් තොරව, විවෘත මනසකින් යුක්තව ක්‍රියා කළ යුතු බව මවිසින් සඳහන් කළ යුතුය.

අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව සිදු කරන පැමිණිලි සංඛ්‍යාව ද ඉතා ඉහලය. අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත අප විසින් යොමු කරනු ලබන ලිපි සඳහා ඔවුන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවේ. මෙම අක්‍රියභාවය හේතුකොට ගෙන අවශ්‍ය වාර්තා ගෙන්වා ගැනීමට සිහි කැඳවීම් කිහිපයක් යැවීමට ද සිදු වේ. කෙසේ වුවද, පාසල් වෙත ළමුන් ඇතුලත්කර ගැනීමට අදාල රීතින් සම්බන්ධයෙන්, විවිධ වෙනස්කම් හඳුන්වාදීමට මෑතකදී ගත් තීරණය පිළිබඳව අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අසල්වාසී පදිංචිකරුවන් අපහසුතාවයට පත් කරමින් අනවසර ගොඩනැගිලි ඉදිකරන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී සමහර පළාත් පාලන බලධාරීන් ඉතාමත් නොසැලකිලිමත් ලෙස ක්‍රියා කරන බව පෙනී යයි. මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට නියෝග කරමින්, බලධාරීන් වෙත බොහොමයක් නිර්දේශ සිදු කරනු ලැබුව ද අවාසනාවකට මෙන්, බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබාදීම සඳහා ඔවුන් කටයුතු නොකරන ලදී.

පරීක්ෂණයක හෝ විමර්ශනයක නිරතව සිටින සියලුම අවස්ථවන් හිදී, යුක්ති යුක්තභාවය හෝ සාධාරණත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට නිසි සැලකිල්ල යොමු නොකරමින්, අභියෝගයට ලක්ව ඇති තීරණය හෝ ක්‍රියාමාර්ගය සාධාරණීයකරණය කිරීම සඳහා නිලධාරීන් තම කාලය සහ ශ්‍රමය වැය කරයි. සිදු කළ වරදේ බරපතලකම සහ පුරවැසියන් වෙත එමගින් සිදු වන හානිකර බලපෑමත්, තමන්ට එරෙහිව එල්ල වන පැමිණිල්ලත් නොසලකමින්, නිලධාරින් දිගින් දිගටම

එවැනිම වැරදි ක්‍රියාමාර්ග හා සාවද්‍ය තීරණ ගැනීමෙහි නිරතව සිටින බව පෙනේ. එබඳු පැවැත්මක් මගින් යහපාලනයේ වැඩි දියුණුවීමක් කිසිදු විටෙක සිදු නොවන අතර, සත්‍ය ලෙසම එය දූෂිතවීමක් සිදු වන බව සඳහන් කළ යුතුය. තවද, සාධාරණ පැමිණිලි ඉදිරිපත් කරන පුරවැසියන් පිළිගැනීමට සහ ඔවුනට ඇහුම්කන් දීමට රජයේ නිලධාරීන් සූදානම් නොමැති නම් එය යහපාලනය තවත් දුර්වල කරනවා ඇත.

අවසාන වශයෙන් සඳහන් කළ යුත්තේ, චෝදනා පිළිබඳ විමර්ශන සිදු කිරීමේදී එම පැමිණිල්ලට අදාල කරුණු පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කර දෙපාර්ශවයටම කරුණු ඉදිරිපත් කිරීමට මෙම ආයතනය අවශ්‍ය කරම් ඉඩකඩ සලසා දෙන බවයි. එසේම, විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, නීතීඥවරුන්ට මෙම ආයතනයේ පරීක්ෂණවලදී පෙනී සිටීමට නොහැකි වීමත් සහ මෙම ආයතනය නිලධාරිවාදය ආරක්ෂා කිරීමට පිටුවහලක් වන ස්ථානයක් නොවීමත්ය.

## <u>සංඛ්‍යාලේඛනාත්මක විශ්ලේෂණය</u>


2018 වසර තුලදී විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි 18ට අමතරව මහජනතාවගෙන් සෘජුව පැමිණිලි 1480ක් මෙම කාර්යාලය වෙත ලැබිණ. එසේම මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණ තවත් පැමිණිලි 90ක් ද විමර්ශනය සඳහා අප කාර්යාලය වෙත යොමු කර තිබිණ. 2017 වසර අවසන් වන තුරු නිම කිරීමට නොහැකිව ඉදිරියට ගෙන ආ පැමිණිලි 616ක ද වැඩකටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුල කටයුතු කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර 2204ක් පැවතිනි.

| වගුව : 1 - සංඛ්‍යානමය විශ්ලේෂණය | | | |
|---|---|---|---|
| 2017 වර්ෂයේ ඉදිරියට ගෙනෙන ලද පරීක්ෂණ සිදුකිරීමට නියමිත ඉතිරි පැමිණිලි සංඛ්‍යාව | | 616 | |
| 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | | | |
| (අ) සෘජුව ලැබුණු පැමිණිලි | 1480 | | |
| (ආ) විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් කාරක සභාව යොමු කරන ලද පැමිණිලි | 18 | | |
| (ඇ) මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් පරීක්ෂණ අරඹා නැවත අප වෙත යොමු කරන ලද පැමිණිලි | 90 | 1588 | |
| 2018 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | | | 2204 |
| 2018 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාව | | | |
| (අ) සහන සැලසීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන පැමිණිලි | | | |
| (1) පරීක්ෂණ සිදු කිරීමෙන් තොරව සමතයකට පත්කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 451 | | |
| (2) සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අදාල ආයතනය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 40 | | |
| (3) අදාල ආයතන හා දෙපාර්තමේන්තු මගින් වාර්තා කැඳවීමෙන් පසු එය පැමිණිලිකරුට දැන්වීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීම නවතාලූ පැමිණිලි | 379 | | |
| (4) වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම් ඉටුවී ඇති පැමිණිලි | 109 | | |
| (ආ) ලසු ලෙස කටයුතු අවසන් කරන ලද පැමිණිලි | | | |
| (1) එකම පැමිණිල්ල සමාන්තර අධිකරණයකට/ ආයතනයකට යොමු කිරීම නිසා පරීක්ෂණ සිදුකිරීමකින් තොරව බැහැර කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 85 | | |
| (2) පරීක්ෂණ සිදුකිරීමට ප්‍රමාණවත් තොරතුරු නොලද පැමිණිලි සංඛ්‍යාව | 36 | | |
| (3) සහනයක් සඳහා යොමුකිරීමට හේතු නොතිබුණ පැමිණිලි | 90 | | |
| (4) ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල වලින් පරිබාහිර පැමිණිලි | 109 | | |
| (5) අධික ලෙස ප්‍රමාදවීම මත ඉදිරිපත් වූ පැමිණිලි | 42 | | |
| (6) මෙම ආයතනයට පිටපත් කරමින් වෙනත් ආයතන වෙත සෘජුව යොමු කළ පැමිණිලි පිටපත් ලෙස කාර්යාලය වෙත ලද පැමිණිලි | 342 | | |
| (7) මූල්‍ය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන් වැනි වෙනත් ආයතන වෙත යොමු කරනු ලැබූ පැමිණිලි | 26 | 1709 | |
| පරීක්ෂණ සිදු කරන ලද සහ අන්තර් පාර්ශව විමර්ශන වලින් අනතුරුව වාර්තා කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | | 16 | 1725 |
| 2018.12.31 දින වන විට පරීක්ෂණ පැවැත්වීමට සහ වාර්තා කිරීමට නියමිත ඉතිරි පරීක්ෂණ සංඛ්‍යාව | | | 479 |

**මාසික විශ්ලේෂණය**

2018 වසර තුලදී ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 2017 වසරේ ඉතිරිව, ඉදිරියට ගෙන ආ පැමිණිලි සංඛ්‍යාව ද සමග 2204ක් විය. අඩුම පැමිණිලි සංඛ්‍යාව වශයෙන් පැමිණිලි 76ක් දෙසැම්බර් මාසයේ දී ලැබුණු අතර වැඩිම පැමිණිලි සංඛ්‍යාව වන 187, අගෝස්තු මාසය තුලදී ඉදිරිපත් විය. අදාල විස්තර 1 වන ප්‍රස්තාරයේ පැහැදිලි කර ඇත.

**ප්‍රස්තාරය: 1 - 2018 වර්ෂයේදී එක් එක් මස තුල ලද පැමිණිලි සංඛ්‍යාව**



වර්ෂය තුල ගොනු කරන ලද පැමිණිලි 1183ක් පුරුෂ පාර්ශවය විසින් ද, 405ක් ස්ත්‍රී පාර්ශවය විසින් ද ඉදිරිපත් කර ඇත. 2 වන වගුවේ ඒවා විස්තර කර ඇත.


**වගුව: 2 -** **2018 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව**

| **මාසය** | **පුරුෂ** | **ස්ත්‍රී** | **එකතුව** |
|---|---|---|---|
| 01. ජනවාරි | 103 | 34 | **137** |
| 02. පෙබරවාරි | 80 | 32 | **112** |
| 03. මාර්තු | 77 | 38 | **115** |
| 04. අප්‍රේල් | 88 | 31 | **119** |
| 05. මැයි | 103 | 25 | **128** |
| 06. ජූනි | 66 | 32 | **98** |
| 07. ජූලි | 134 | 50 | **184** |
| 08. අගෝස්තු | 152 | 35 | **187** |
| 09. සැප්තැම්බර් | 113 | 39 | **152** |
| 10. ඔක්තෝබර් | 121 | 44 | **165** |
| 11. නොවැම්බර් | 82 | 33 | **115** |
| 12. දෙසැම්බර් | 64 | 12 | **76** |
| **එකතුව** | **1183** | **405** | **1588** |

**දිස්ත්‍රික්ක විශ්ලේෂණය**

2018 වර්ෂය තුල වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එය 272කි. අනතුරුව, වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස කළුතර දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 129ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 118ක් ද ලැබුණි.

**ප්‍රස්තාරය: 2 -** <u>පැමිණිලිකරුවන්ගේ නිත්‍ය පදිංචි දිස්ත්‍රික්කය අනුව කරන ලද වර්ගීකරණයට අනුව **2018** වර්ෂයේදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව</u>



**විෂය විශ්ලේෂණය**

2018 වර්ෂය තුල දී කාර්යාලවලට සේවකයන් පත්කිරීම, සේවය අවසන් කිරීම, උසස්වීම්, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල් ඉල්ලා සිටීම්, බලය අනිසි ලෙස යෙදවීම, අදාල නිලධාරීන් ක්‍රියාත්මක නොවීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලු, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම, අනවසර ඉදිකිරීම් සහ හිරිහැර කිරීම් යන කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබුණි.

වගුව 3 : - <u>2018 වර්ෂය තුළ විෂයානුගතව මහජන නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි මුළු සංඛ්‍යාව</u>

| | **විෂය** | **2018 වර්ෂය** |
|---|---|---|
| 1 | ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදානය | 232 |
| 2 | විවිධ | 183 |
| 3 | සේවා අන්තර්ග්‍රහණය කිරීම්, බඳවා ගැනීම්, පත්වීම්, ස්ථිර කිරීම්, පෙරදාතම් කිරීම් | 163 |
| 4 | උසස්වීම්, ජ්‍යෙෂ්ඨත්වය | 119 |
| 5 | වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා | 110 |
| 6 | විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප | 104 |
| 7 | සේවා ස්ථානයෙන් මාරු කිරීම | 103 |
| 8 | සේවය අවසන් කිරීම්, නැවත සේවයේ පිහිටුවීම්, දීර්ඝ කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් | 100 |
| 9 | විශ්ව විද්‍යාල/පාසැල් වලට ඇතුලත් වීම, විභාග ප්‍රතිඵල | 94 |
| 10 | ප්‍රමාදය, නොහැකියාව, නොසලකා හැරීම, බලය අනිසි ලෙස භාවිත කිරීම | 93 |
| 11 | අනවසර ඉදිකිරීම්/පීඩාවන් | 59 |
| 12 | සේවා ස්ථානයේ දී වන හිරිහැර | 51 |
| 13 | මාර්ග පද්ධති | 39 |
| 14 | වන්දි ගෙවීම, දුප්පතුන්ට සහනාධාර, සමෘද්ධි | 32 |
| 15 | බලපත්‍ර, ගොඩනැගිලි අවසර පත්‍ර | 28 |
| 16 | සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනා | 27 |
| 17 | ණය, අයකිරීම්, නැවත උපලේඛනගත කිරීම | 17 |
| 18 | විදුලිය, ජලය, දුරකතන සම්බන්ධ කිරීම් හා විසංධි කිරීම් | 17 |
| 19 | පොලිසිය බලය අනිසි ලෙස භාවිත කිරීම/අක්‍රීය වීම | 14 |
| 20 | සුනාමි සහනාධාර | 3 |
| | **මුළු ගණන** | **1588** |

**අමාත්‍යාංශ/ මහජන ආයතන විශ්ලේෂණය**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල නිලධාරීන්ට එරෙහිව පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇත. පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට එරෙහිව වන අතර ඒවායෙන් බොහොමයක් රජයේ ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම සහ ප්‍රදානයන් ලබා දීම් වලට අදාලව වේ. විමර්ශන වලදී පැහැදිලි වී ඇත්තේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ඇතැම් නිලධාරීන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරපත්/ප්‍රදානයන් නිකුත් කිරීමේදී විවෘතව හා අවංක බවින් යුතුව කටයුතු නොකරන බවය.

වගුව 4 :- <u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි සහ රජයේ ආයතන වල නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි සංඛ්‍යාව - 2018</u>

| **අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ආදී ...** | **සංඛ්‍යාව 2018** |
|---|---:|
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන | 239 |
| විවිධ ආයතන | 230 |
| රාජ්‍ය පරිපාලන | 223 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 215 |
| ආරක්ෂක සහ අභ්‍යන්තර ආරක්ෂක | 92 |
| සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය | 75 |
| සංස්ථා, අධිකාරි (CPC, CEB, SLAA, RDA) | 68 |
| විශ්‍රාම වැටුප් | 63 |
| රාජ්‍ය සේවා කොමිසම (මධ්‍යම සහ පළාත්) | 49 |
| ගමනාගමන (SLCTB, CGR, CMV) | 47 |
| වාරිමාර්ග සහ මහවැලි අධිකාරිය | 42 |
| ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 42 |
| කෘෂිකර්ම | 31 |
| තැපැල් සහ විදුලි සංදේශ | 29 |
| මුදල් | 24 |
| රජයේ බැංකු | 22 |
| කම්කරු | 18 |
| සමාජ සේවා/ සමෘද්ධි/ තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය | 17 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 17 |
| සමුපකාර සංවර්ධනය | 16 |
| වන සංරක්ෂණ | 10 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් | 8 |
| වැවිලි | 6 |
| අධිකරණ | 5 |
| **මුළු** | **1588** |

**කාර්ය මණ්ඩලය**

මෙම කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව 32 කි. කෙසේ වුවද, සංවිධාන ධූරාවලියේ පෙන්වා ඇති පරිදි 2018 වසරේ අවසානය වන විට මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබුණේ නිලධාරීන් 22 දෙනෙකු පමණි. (පහත සටහන බලන්න)

**සංවිධාන ධූරාවලිය**

**ඔම්බුඩ්ස්මන්**

භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) -01
(I පංතිය)
භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/සිංහල) -01
(I පංතිය)

**පරිපාලන නිලධාරි -01**
ආයතන

(රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.II ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 03
(තො.ස.තා.ස.) (පුරප්පාඩු) - 01

රියදුරු (පුරප්පාඩු) - 02
කා.සේ.සේ.II - 01
කා.සේ.සේ.III - 03
කා.සේ.සේ. (පුරප්පාඩු) - 02
සනී/කම්කරු (කොන්ත්‍රාත් පදනම) (පුරප්පාඩු) - 01

**පරිපාලන නිලධාරි -01**
පැමිණිලි (පුරප්පාඩු)

(රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.II ශ්‍රේණිය) - 01
(රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 08
(රා.ක.ස.සේ.) (පුරප්පාඩු) - 03

**වාර්ෂික අයවැය**

පුනරාවර්තන වියදම් වශයෙන් රු.24,009,000.00ක මුදලක් ද, ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.1,233,000.00ක මුදලක් ද වශයෙන් රු.25,242,000.00 ක මුළු මුදලක් 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද අතර, මෙම වසර සඳහා තත්‍ය වියදම රු.25,033,000.00ක් වූ අතර, ඉතිරි වූ ප්‍රතිපාදන රු:209,000.00කි.

## ශීර්ෂ 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
## 01 - මෙහෙයුම් ක්‍රියාකාරකම්
## 01 - සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා

**රු:000**

| විෂය | විස්තරය | 2018 | 2018 |
|---|---|---|---|
| | | ශුද්ධ ප්‍රතිපාදන | තත්‍ය වියදම් |
| | | | |
| | **මුළු පුනරාවර්තන වියදම්** | **24009** | **23869** |
| | **මුළු පුද්ගලික පඩිනඩි** | **10170** | **10163** |
| 1001 | වැටුප් හා වේතන | 7163 | 7162 |
| 1002 | අතිකාල හා නිවාඩු දීමනා | 135 | 135 |
| 1003 | වෙනත් දීමනා | 2872 | 2866 |
| | **ගමන් වියදම්** | **630** | **621** |
| 1101 | දේශීය | 30 | 25 |
| 1102 | විදේශ | 600 | 596 |
| | **සැපයීම්** | **940** | **896** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 565 | 562 |
| 1202 | ඉන්ධන | 260 | 227 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 115 | 107 |
| | **නඩත්තු වියදම්** | **926** | **9** |
| 1301 | වාහන | 569 | 569 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 150 | 139 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 207 | 195 |

| | | | |
|---|---|---|---|
| | **ගිවිසුම්ගත සේවා** | **10858** | **10802** |
| 1401 | ප්‍රවාහන | 10 | 8 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 570 | 562 |
| 1403 | විදුලිය හා ජලය | 1488 | 1452 |
| 1404 | කුලී හා දේශිය බදු | 7970 | 7970 |
| 1409 | වෙනත් | 820 | 810 |
| | **මාරු කිරීම්** | **485** | **484** |
| 1505 | සම්මාදම් හා දායක මුදල් | 350 | 350 |
| 1506 | දේපල ණය පොලී | 135 | 134 |
| | **ප්‍රාග්ධන වියදම්** | **1233** | **1164** |
| | **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම** | **1183** | **1162** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1183 | 1162 |
| | **හැකියා වර්ධනය** | **50** | **02** |
| 2401 | පුහුණු හා හැකියා වර්ධනය | 50 | 02 |
| | **මුළු වියදම** | **25242** | **25033** |
| | **මුළු මූල්‍යකරණය** | **25242** | **25033** |
| | **මූල්‍ය** | | |
| | **දේශීය** | **25242** | **25033** |

**නිගමනය**

පුරවැසියන්ගේ දුක්ගැනවිලිවලට සහනයන් ලබා දෙන්නාවූත්, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්නාවූත්, ගරුත්වය ලබා දෙන්නාවූත්, එමෙන්ම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය තුල විශ්වාසය තහවුරු කරන්නාවූත්; ස්වාධීන, අපක්ෂපාතී, ලාභදායි ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයකට ප්‍රවේශ වීමට පුරවැසියන්ට හැකියාව ලබා දෙන්නා වූ වේදිකාවක් ඔම්බුඩ්ස්මන් ක්‍රමය මගින් සපයනු ලැබේ. යහපාලනය නූතන සමාජයේ මූලික අවශ්‍යතාවයක් වේ. පරිපාලනයේ දෛනික කාර්යයන් ඉටු කිරීම සඳහා වගකිවයුතු රාජ්‍ය යාන්ත්‍රණයක් වෙත, පුළුල් ලෙස මහජන සුබසිද්ධිය සැලසීමෙහිලා පරිපාලනය සුමට ලෙස පවත්වාගෙන යාම සඳහා සුවිශාල බලයක් පැවරී ඇත. එලෙස බලතල ලබාදීම හේතුවෙන්, එය රීති, රෙගුලාසි, ස්වාභාවික යුක්තිය සහ සමානාත්මතාවය උල්ලංඝනය කිරීම සඳහා එම බලතල අදාල කර ගත යුතු බවක් අදහස් නොවේ.

නොමනා ලෙස පරිපාලනමය කටයුතු සිදු කිරීම හේතුවෙන් කිසියම් පුද්ගලයෙකුට අසාධාරණයක් සිදු වී ඇත්නම් එය හඳුනාගෙන පරීක්ෂාවට භාජනය කිරීමෙන් අනතුරුව එය නිවැරදි කරමින් සහනයක් සලසාදීම සඳහා ඔම්බුඩ්ස්මන් කාර්යාලය විවෘත කර ඇත. ඔම්බුඩ්ස්මන් ආයතනය මගින් සලකා බලනු ලබන සහ නිවැරදි කරනු ලබන ප්‍රධාන කරුණ වනුයේ දූෂිත හෝ පක්ෂග්‍රාහී අරමුණු වෙනුවෙන් බලතල අත්තනෝමතික ලෙස ක්‍රියාවෙහි යෙදවීම හෝ නිල වගකීම් ඉටු කිරීමේදී එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම වේ.

අධිකරණය වෙතින් සහන අපේක්ෂා කිරීම විශාල වියදම් දැරිය යුතු කටයුත්තක් වී ඇත. අධිකරණය වෙත හෝ විනිශ්චය සභාවක් වෙත යාම, ප්‍රමාණවත් තරම් මුදල් තිබීම මත රඳා පවතී. එසේම, වසර ගණනාවක් තිස්සේ ලැබෙන පැමිණිලි සංඛ්‍යාව මත පදනම්ව සංස්ථානික ගැටලු පෙන්වාදීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා සතු බලතල සහ ඒ සඳහා ඇති පළපුරුද්ද නිසා පරිපාලනමය දෝෂ විසඳීම සඳහා අධිකරණයකට වඩා බොහෝ විට ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු වීම වඩා ඵලදායි වේ. එය වඩාත් නම්‍යශීලී සහ අඩු පිරිවැයක් සහිත ඵලදායී ක්‍රමයකි. ඊට අමතරව, ඔම්බුඩ්ස්මන් ආයතනය විශේෂයෙන්ම ජනගහනයෙහි සිටින වැඩි අවදානම් සහිත කණ්ඩායම් වලට, සාමාන්‍යයෙන් අඩු වියදමකින් ආරම්භක ප්‍රවේශයක් ලබා දෙන අතර මෙමගින් පිළියම් සෙවීම සඳහා ඔවුන් සතු හැකියාව වඩාත් ශක්තිමත් කරන බැවින්, සාම්ප්‍රදායික අධිකරණ පද්ධතියකට වඩා වාසි සහගතය.

ඔම්බුඩ්ස්මන් පනත පැනවීම මගින් අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමෙහිලා නිලධාරීන් විසින් දක්වන ආකල්පය පිළිබඳව ද අදහස් දැක්වීම අවශ්‍ය කරුණක් වේ. මෙම කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු පරීක්ෂා කිරීමේදී, සමහර රාජ්‍ය නිලධාරීන් සිය රුචිකත්වයන්

අනුව නීති, රෙගුලාසි සහ රීතීන් නොසලකමින් හෝ ස්වකීය අභිමතය පරිදි ඒවාට අර්ථනිරූපණයන් ලබා දෙමින් තීරණ ගැනීමේ අවස්ථාවන් මවිසින් නිරීක්ෂණය කොට ඇත. මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් කඩවන අන්දමේ වැරදි ක්‍රියාවන් සිදු කිරීම මගින් යම් තැනැත්තන් හට නීත්‍යානුකූලව ලැබිය යුතු දේ අහිමි වීමත්, ඊට අමතරව ඇතිවන සිත් වේදනාවත්, රාජකාරි ඉටු කිරීමේදී නිලධාරීන් විසින් අමතක කර දමයි.

සමහර නිලධාරීන් සන්සුන් ලෙස ගැටලු විසඳීමට අකමැති හෝ එසේ නොමැති නම් නොහැකියාව ද මවිසින් නිරීක්ෂණය කර ඇත. විශේෂයෙන්ම, පාර්ශවකරුවන් අතර ඇති වන ආරවුල් වැනි ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඇතැම් නිලධාරීන් ප්‍රමාණවත් තරම් සමත්කම් නොදක්වන බව හෝ ඔවුන්ගේ ගැටලු විසඳීම සම්බන්ධයෙන් ඇති නොහැකියාව ද පෙනෙන්නට ඇත. ගැටලු සුහදව නොවිසඳීමේ ක්‍රියාව ඔවුන් තුලින් පිළිඹිබු වන්නේ, පැමිණිලිකරුවෙකු හට විරුද්ධවාදියෙකු ලෙස සැලකීමේ ආකල්පය සහ රාජකාරීමය වශයෙන් සිදු වූ වැරැද්ද පිළිගැනීමට ඔවුන් තුල ඇති අකමැත්ත යනාදී හේතු නිසාය.

මෙම කාර්යයේදී ගැටලු සහ දුෂ්කරතා එක්තරා ප්‍රමාණයකට මතු වුවත්, මාගේ රාජකාරි කටයුතු වඩාත් ඵලදායි ලෙස ඉටු කර ගැනීමට හැකිවන අයුරින් නිලධාරීන්, දෙපාර්තමේන්තු සහ බලධාරීන් විසින් දක්වන සහයෝගය සැලකිය යුතු මට්ටමක පවතින බව ද මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුය.

අවසාන කරුණක් වශයෙන්, මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින්, ඔවුන් මුහුණපාන දුෂ්කරතා මධ්‍යයේ වුවද, ලැබෙන පැමිණිලි සැලකිය යුතු සංඛ්‍යාවක කටයුතු අවසන් කිරීමට සමත් වී ඇති බව මවිසින් සඳහන් කළ යුතුය. කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණ කර නැත. ගණකාධිකාරිවරයෙකු හෝ පොත් තබන්නෙකු හෝ මෙම කාර්යාලයට පත් කර නොමැත. මේ හා සමාන කාර්යයන් ඉටු කරන ආයතනවල කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන දීමනාවන් මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නොගෙවීම නිසා මෙම කාර්යාලයේ සේවය කිරීමට නිලධාරීන් අකමැත්තක් දක්වන බව ද සැලකිල්ලට ගත යුතුය.

මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන දුෂ්කර කර්තව්‍ය අගය නොකරන්නේ නම් එය මවිසින් සිදු කරන අතපසුවීමක් බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුමය. අප විසින් ලඟා කර ගත යුතු ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සියලු බාධකයන් පසෙකලා රාජකාරි කටයුතු ඉටු කරන මාගේ කාර්ය මණ්ඩලය වෙත කෘතඥතා පූර්වක ස්තූතිය පිරිනමමි.

විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන්)